
# හීන් ඇඳිරියේ



පෙම් ගී පිළිබඳව සාකච්ඡා කිරීමේදී මූලිකව අපි දෙවර්ගයක් ගැන සිහිපත් කරන්නෙමු. විරහ වේදනාව මුල් කොටගත් විප්‍රලම්භ ශෘංගාරය දනවන ගීත මෙන්ම ප්‍රේමයේ ආහ්ලාදයෙන් ඇලලී ගිය සම්ප්‍රයෝග ශෘංගාරය දනවන ගීතයි ඒ දෙවර්ගය.

නානාප්‍රකාර ගී පද නිබන්ධකයෝ නා නා අන්දමට පෙම් ගී පබඳින්නෝ, ඉන් කිසිසේත්ම සෑහීමකට නම් පත් නො වන්නෝ ය. තමන්ගේ සිතට ඉබේම පහළ වෙන අදහස් මෙන් ම සිතා මතා ආයාසයෙන් පබඳින ගී මේ අතර ප්‍රධාන වෙයි. මෙහිදී නිමිති කොට ගැනෙන්නේ තමන්ගේ ම අත්දැකීම් පමණක්ම නොවේ. දක්ෂ පද රචකයෙකුට අන් අයෙකුගේ අත් දැකීමකට වුව මානසිකව අනුගතව සංවේදී පද රචනයක් කළ හැකි වෙයි. තවත් කෙනෙක් අදහස කියා, ලියා දෙන්නැයි ඉල්ලා සිටින පද රචනාත් මේ ගණයටම ගැනෙයි. මීට අමතරව පූර්ව නිර්මිත තනුවකට තමන්ගේ සිතෙහි පහළවන අදහසක් ලියා දැක්විය හැකියි. එහෙත් ඒ සීමිත ගී පද නිබන්ධකයින් කීප දෙනෙකුට පමණක් ඇති වෙනම ම දක්ෂතාවයකි.

මොන යම් ගී පද රචනාවක වුවද ඊට අනුභූතිය වෙන කාරණයක්, ඊට නිමිත්ත ලෙස යොදා ගන්නා දේත් නැවුම් වෙන තරමට ගී පද නිබන්ධනය අපූර්වත්වයෙන් යුක්ත වෙයි. ගී පද නිබන්ධකයෙකුගේ සිතට කම්පනයක් ඇති කරවන කාරණය ''අනුභූතියයි'' එකී කාරණය එලෙසින්ම විවෘතව නො ලියා, වඩාත් දැනෙන ලෙස කියා පෑමට නිබන්ධකයා යෙදා ගන්නා දේ ''නිමිත්ත'' වෙයි.

''හීන් ඇඳිරියේ'' ගීයේ අනුභූතිය වෙන්නේ කිසිවෙකුගේ ආදරයක් නො ලබන යෞවනියක්. අනුභූතිය කියා පෑමට නිබන්ධකයාණන් නිමිත්ත කර ගන්නේ අපගේ ජන ප්‍රවාදයේ එන චරිතයක්. අපගේ පැරණි ඇදහිලි වලට අනුව ''කළු කුමාරයා'' යනු යක්ෂයෙකි. තරුණ කාන්තාවන්ට අනවින කරන, ලෙඩ රෝග ඇති කරවන යක්ෂයෙකු ලෙසිනුයි කළු කුමාරයා පිළිබඳව ජන ශ්‍රැතියේ කියැවෙන්නේ.

කිසිඳු තරුණයෙකුගේ අවධානයට ලක් නොවෙන, කිසිඳු තරුණයෙකුගේ ආදරය නොලබනා, කිසිවෙකුගෙන් විවාහ යෝජනාවක්වත් නො එනා යෞවනියකට ''මොන යකෙකු'' හෝ කම් නැතැයි සිතෙන අවස්ථා නැතුවා ම නොවේ. කළු කුමාරයා නිතර ගැවසෙනුයේ දිය පහරවල් අසළ යැයි ප්‍රවාදයේ කියැවේ. තරුණයින් වසඟ යට ගන්නා මෝහිණිය සේම ''බිම් කරුවල'' වැටෙනා '' ගොම්මන්'' වෙලාවලදීයි කළු කුමාරයාත් දිය මංකඩ අසළ සැරිසරන්නේ. කාන්තාවන්ට ගොම්මන් වේලාවට තනියම දිය නෑමට එවන් තැන්වලට නොයනා ලෙසයි ගැමි වැඩිහිටියන් අවවාද කරන්නේ. මේ විශ්වාසය නිසාත්, වැඩිහිටියන්ගේ අවවාද නිසාත් ගැමි කාන්තාවෝ සිහින් ඇඳිරිය වැටීගෙන එන වෙලාවට දිය පහරවල් අසළ ගැවසීමට බිය වෙති.

එහෙත් කිසිවෙකුගේ ආදරයක් නොලබන ''හීන් ඇඳිරියේ'' ඔයේ මංකඩ ළඟට වී බලා සිටින්නී, තමන් දුටුවේ නැතිදැයි ''කළු කුමාරයා ගෙන්'' විමසන්නේ ඒ සියළු බිය පහ වී ඇති නිසාවෙනි. කළු කුමාරයා හෝ තමන්ගේ තනිය මකන්නේ නම් ඇයට කමක් නැති. කළු කුමාරයා හෝ තමන්ට ලෙන්ගතුකම් පාන්නේ නම් ඇයට බියක් නැති. ඇයට ගැටළුව වන්නේ කළු කුමාරයාටවත් ඇය පිළිබඳව දුකක් ඇති නොවීමයි. ඇය ගැන පහළ වුණ දුක නිසාවත් ලෙන්ගතුකමක් ඇති නො වීමයි.

තරුණයෙකු හා විවාපත්ව කුල ගෙදරට යන යෞවනියක දායාද කොට ගෙනයන කළමනා අතර පැදුරත් එක් අංගයක්. රටා තියා තමන්ම වියා ගත් පැදුරේ මයි මේ යෞවනිය රෑ සැතපෙන්නේ. ඒ රටා මැකී යන්නේ ඇයගේ සිතෙහි උපදින දුක නිසා ගලා හැලෙන කඳුලින්. සෑම රැයක් පාසාම තනිකම දැනෙනා ඇගෙන් ගලනා කඳුලින්. සෑම රැයක් පාසාම තනිකම දැනෙනා ඇගේන් ගලනා කඳුළු සිප ගන්නේ පැදුරයි. ඒ පැදුරේ රටාවල් කඳුලින්ම සේදී යන සේය දැන්.

මේ අපූරු අදහස ඉතාම කෙටියෙන් ලියැවුණේ රියැන්සි නිහාල් නම් ප්‍රවීණ ගී පද නිබන්ධකයාණන්ට. පද රචනා දහස් ගණනින් නො ලියුවද ලියූ පද රචනා ප්‍රබල නිර්මාණ වෙන නිසා ම රචකයා ප්‍රවීණයෙකු බවට රසිකයා දැන හඳුනා ගන්නේ නිරායාසයෙන්ම.

ගීතයක තිබිය යුතු ලකුණු සියල්ල දැක්වෙන මේ සරල පද මාලාවට ''හීන් ඇඳිරියේ'', ''මංකඩේ'', ''නැද්ද'', ''දැක්කෙ'', ''ලෙන්ගතුකම්'', ''ඉඹී'', යන ගැමි වදන් බස් වහරේ එන සැටියෙන්ම මුසු කර ඇත්තේ කිසිඳු ආගන්තුක බවකින් තොරවයි. අන්තරා කොටස් දෙකෙහිම මුල් පද අග එළිසමය රැකීමෙන් ධ්වනි පූර්ණ ගුණයද පද පෙළට මුසු වෙයි.

මේ අපූරු ගීයට තනුවක් නිර්මාණය කර සංගීතවත් කරන්නේ ආචාර්ය රෝහණ වීරසිංහයන්. ආදරයක් නොලබන යුවතියකගේ සිතෙහි ජනිත ශෝකාලාපයකට වේදනාව මුසු කරවන තනුවකි මේ නිර්මාණය. පද රචනාවේ කෙටි බව මඟ හරවාලමින් දෙවර බැගින් ගායනා වෙන්නට සළස්වන අන්තරා කොටස්වල මුල් පද මෙන් ම ''කළු කුමාරයෝ'' වදන් ද යුවතියගේ ශෝකී බව ඉහළ නංවන්නට ගන්නා උත්සාහයක්. ''කළු කුමාරයෝ'' ලෙසින් විමසන පැණය දෙවරක් ම ගැයීමේදී දෙයාකරයකින් ගැයෙන්නට නිර්මාණය වීමෙන් එකී පැණය තව දුරටත් අවධාරණය කරයි. නවීන සංගීත මෙවලම් යොදා ගනිමින් පද රචනාවේ අරුතටත්, තනුවටත්, මනාව ගැලපෙන සේ නිර්මාණය වෙන සංගීතයෙන් රම් පරිසරයේ ඇති බියකරු බව මොනවට සවනට සන්නිවේදනය කරයි.

මෙවන් ප්‍රබල පද රචනාවක් තෝරාගෙන හැඟීම්බවර ගයනා ශිල්පිනිය දීපිකා ප්‍රියදර්ශනී විශාරදවරියයි. ''මල්වරුසා'' ගී එකතුව වෙනුවෙන් තෝරාගත් නව පද රචකයින් සත් දෙනාගෙන් එක් අයෙකුගේ මෙම පද රචනාවටත් ආචාර්ය රෝහණ වීරසිංහයන්ගේ හැඟුම්බර තනුවටත් උපරිමයෙන් දායක වෙන්නී, දීපිකා ප්‍රියදර්ශනිය සිය සෞම්‍ය, ගායනීය, මිහිරි හඬින් අපූරුවට භාවයන් එක් කරන්නීය. ඒ, සුපුරුදු ලෙසින් තම හඬෙහි ආත්මය පද පෙළෙහි යුවතියගේ ශෝකය සමඟ ඒකාත්මික කරවමිනි.

හීන් ඇඳිරියේ
ඔයේ මංකඩේ
මං ඉන්නවා දැක්කෙ නැද්ද
කළු කුමාරයෝ......,?

මගෙ තනිකම නැති කරන්න
මට ලෙන්ගතුකම් පාන්න
නුඹටත් දුක හිතුනෙ නැද්ද
කළු කුමාරයෝ....?

රටා මැකෙන පන් පැදුරත්
කඳුළු ඉඹී හැමදාමත්
නුඹටත් දුක හිතුනේ නැද්ද
කළු කුමාරයෝ.

රචනය: රියැන්සි නිහාල්
තනුව සහ සංගීතය:
ආචාර්ය රෝහණ වීරසිංහ
ගායනය: විශාරද දීපිකා ප්‍රියදර්ශනී



සිසිර දිසානායක